Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය

## ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය

## ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව - 2020/21

ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය මගින් සිංහල භාෂාවෙන් පවත්වනු ලබන ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා වයස අවුරුදු 18-35 (රජයේ සේවයේ නියුක්තව සිටින්නන්ට වයස් සීමාව 45ට නොවැඩි විය යුතුය) අතර සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :*

1.1 අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) පරීක්ෂණයේ දී සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය/අංක ගණිතය ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06කින් සම්මාන 03ක් සහිතව සමත් විය යුතුය.

තවද, ඔහු හෝ ඇය,

(අ) පිළිගත් ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ පාසලක යටත් පිරිසෙයින් මාස 06 පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම,

හෝ

(ආ) ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ හෝ සිවිල් ආරක්ෂක අංශයේ පුහුණු කිරීමේ ආයතනයක, පාසලක ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම,

හෝ

(ඇ) පාසල් ක්‍රීඩා ගුරුවරයකු හෝ ගුරුවරියක් වශයෙන් හෝ පළාත් පාලන ආයතනයක ක්‍රීඩා භූමි උපදේශකවරයෙකු හෝ උපදේශකවරියක් වශයෙන් හෝ යටත් පිරිසෙයින් වසර 05ක පළපුරුද්දක් සහිතව ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශේෂ දක්ෂතාවයක් දක්වා තිබීම.

හෝ

(ඈ) කිසියම් ක්‍රීඩාවක් සම්බන්ධයෙන් ජාතික ක්‍රීඩා කණ්ඩායමක සාමාජිකයකු විය යුතු අතර කිසියම් ජාත්‍යන්තර තරගයකට සහභාවී තිබීම.

හෝ

(ඉ) ක්‍රීඩා අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන ජාතික මහා ක්‍රීඩා උළෙලේ දිස්ත්‍රික්ක මට්ටම් තරගයක දී ප්‍රථම හෝ දෙවන ස්ථානය ලබා තිබීම. එසේ *නැතහොත්* ජාතික ක්‍රීඩා සංගමයකින් පවත්වනු ලබන ජාතික මට්ටමේ තරගයකදී ප්‍රථම, දෙවන හෝ තෙවන ස්ථානය ලබා තිබිය යුතුය.

1.2 නියමිත ආකෘතිය ප්‍රකාරව සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2. *අයදුම්පත් එවීමේ ක්‍රමය :-*

2.1 ඉහත සඳහන් අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් හෝ අපේක්ෂිකාවන් විසින් මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය පරිදි 8" x 13 1/2" ප්‍රමාණයේ කඩදාසියක සකස් කරගත් අයදුම්පත් තම අත් අකුරින් සම්පූර්ණ කර 2020.03.27 වන දිනට හෝ ඊට පෙර අධ්‍යක්ෂ, ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය, අංක 100/7, නිදහස් මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

2.2 අයදුම්පත බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ ''2020 ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම්පත'' යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

2.3 රජයේ, පළාත් පාලන සේවයේ, සංස්ථා සේවයේ නියුතු නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්, අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය. එසේ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. *තෝරාගැනීම :*

මෙම පාඨමාලාව සඳහා ලැබෙන අයදුම්පත් අතරින් සුදුසුකම් සම්පූර්ණ කර ඇති සියලු දෙනා ලිඛිත පරීක්ෂණයකට කැඳවනු ලබන අතර, බඳවා ගැනීමේ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ලකුණු ලබාගත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට හා ශාරීරික යෝග්‍යතා ප්‍රායෝගික පරීක්ෂණයකට කැඳවීමෙන් පසුව පාඨමාලාව සඳහා තෝරාගනු ලැබේ.

4. *පාඨමාලාව පිළිබඳ විස්තර :*

4.1 විෂය නිර්දේශය පහත සඳහන් පරිදි කොටස් 05කින් සමන්විත වේ.

(අ) පුහුණුවීමේ සාමාන්‍ය සිද්ධාන්ත
ශාරීරික ගුණාංග හා හැකියාවන්, තාක්ෂණ ක්‍රම, උපාය මාර්ග, පුහුණුවීම් ක්‍රම, සැලසුම් ක්‍රම භාරය හා පරීක්ෂණ පිළිබඳ මූලධර්ම සහ වාචික පරීක්ෂණයකින් සමන්විත වේ.

(ආ) අවම වශයෙන් ක්‍රීඩා 10ක් පිළිබඳ න්‍යායික හා ප්‍රායෝගික දැනුම

(ඇ) ජවන හා පිටිය මලල ක්‍රීඩා පිළිබඳ විශේෂඥතාවය

(ඈ) ජවන හා පිටිය මලල ක්‍රීඩාවලට අමතරව ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලා කාලය තුළ කාන්තා හෝ පිරිමි අය සඳහා අවස්ථානෝචිත පරිදි තෝරා ගන්නා ලද එක් ක්‍රීඩාවක් පිළිබඳ විශේෂඥතාවය

(ඉ) ක්‍රීඩා කායික විද්‍යාව, ක්‍රීඩා සමාජ විද්‍යාව, ක්‍රීඩා පරිපාලන, ක්‍රීඩා සංඛ්‍යානය, ක්‍රීඩා උත්සව සංවිධාන ක්‍රම, ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව, ක්‍රීඩා ජීව රසායන විද්‍යාව, ක්‍රීඩා පෝෂණය සහ ක්‍රීඩා මනෝවිද්‍යාව වැනි පොදු විෂයයන් පිළිබඳ දැනුම.

4.2 පාඨමාලාවේ කාලසීමාව මාස 12කි.

4.3 මෙම පාඨමාලාව සඳහා තෝරාගනු ලබන, අයදුම්කරුවන් විසින් රු. 60,000.00 ක මුදලක් පාඨමාලා ගාස්තු වශයෙන් පාඨමාලා ආරම්භ කිරීමට පෙර ගෙවිය යුතු අතර පාඨමාලා සඳහා බඳවා ගනු ලබන්නේ පාඨමාලා ගාස්තු ගෙවා අවසන් කළ අපේක්ෂකයන් පමණි. එමෙන්ම මෙම මුදල චෙක්පතකින් ගෙවන්නේ නම් ''ලේකම්, ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය'' යනුවෙන් සටහන් කළ යුතුය. මෙම මුදල කුමන හේතුවක් නිසාවෙන් ආපසු ගෙවනු නොලැබේ.

4.4 පාඨමාලා හැදෑරීම සඳහා තෝරාගනු ලබන අය, ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ නීති හා රෙගුලාසි පිළිපැදීමට බැඳී සිටිය යුතුය.

4.5 පාඨමාලාව සාර්ථකව නිම කරන අය සඳහා ''ක්‍රීඩා ඩිප්ලෝමා'' සහතික පත්‍රය ප්‍රදානය කරනු ලැබේ.

5. *අනෙකුත් කොන්දේසි :*

5.1 පාඨමාලාව අවසානයේදී රැකියාවක් ලබාදීමට මෙම අමාත්‍යාංශය බැඳී නැත.

5.2 එසේකුදු වුවත්, පාඨමාලාව හදාරන්නන් විසින් ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂ සමග ගිවිසුමකට එළඹිය යුතු යැයි මෙම අමාත්‍යාංශය අදහස් කරන්නේ නම්, එම ගිවිසුමට එළඹීමට පාඨමාලාව හදාරන්නන් බැඳී සිටිය යුතුය.

5.3 පවතින ඉහළම සුදුසුකම් හෝ ඉල්ලා ඇති සුදුසුකම් අයදුම්පතෙහි සඳහන් කළ යුතු අතර සඳහන් නොකරන ලද දත්ත පසුව ඉදිරිපත් කළ ද බාරගනු නොලැබේ.

5.4 මෙහි ආවරණය නොවන අනිකුත් කරුණක් වේනම්, ඒ සම්බන්ධයෙන් ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂ, සිය අභිමතය පරිදි කටයුතු කරනු ඇත.

අධ්‍යක්ෂ,
ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය.

2020 පෙබරවාරි මස 18 වැනි දින,
100/7, නිදහස් මාවත,
කොළඹ 07.

*ආදර්ශ අයදුම් පත්‍රය*

**ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය**

*ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව - 2020*

01. (i) සම්පූර්ණ නම :—————. මයා./මිය./මෙනවිය
(ii) මුලකුරු සමග නම :—————.
(iii) සම්පූර්ණ නම :
(ඉංග්‍රීසි භාෂාවෙන්
කැපිටල් අකුරෙන්)

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | |

(iv) ජාතික හැඳුනුම්පත් අංකය | | | | | | | | | | | | |

02. ලිපිනය (i) පෞද්ගලික :—————.
(ii) රාජකාරි :—————.

03. දුරකථන අංකය (පෞද්ගලික) :—————. දුරකථන අංකය (රාජකාරි) :—————.

(i) උපන් දිනය : වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | | |

(ii) 2020.03.27 දිනට වයස : අවුරුදු : | | | මාස : | | | දින : | | |

04. ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? නැතිද? යන වග :—————.

05. පුරවැසියෙක් නම්, ලියාපදිංචි වීමෙන්ද? පරම්පරාවෙන්ද? යන වග :—————.

06. (i) ස්ත්‍රී/පුරුෂ භාවය :—————.

(ii) විවාහක/අවිවාහක බව :—————.

07. ඔබ රැකියාවක් කරයි ද? / නොකරයි ද? යන වග :
(i) තනතුර :—————.
(ii) සේවා කාලය :—————.
(iii) සේවා ස්ථානය :—————.

08. (i) අධ්‍යාපන සුදුසුකම් - අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය :

වර්ෂය : | | | | | විභාග අංකය :—————.

| *විෂයය* | *සාමාර්ථයන්* | *විෂයය* | *සාමාර්ථයන්* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය ෘ

වර්ෂය ෘ ☐☐☐☐

විභාග අංකය :————.

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

(iii) වෙනත් අධ්‍යාපන සුදුසුකම් (උසස් විභාග/උපාධි)

වර්ෂය ෘ ☐☐☐☐

විභාග අංකය :————.

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |

08. ක්‍රීඩා දක්‍ෂතාවයන් (ලබා ඇති ඉහළම ක්‍රීඩා සහතික හා විශේෂ දස්කම් පිළිබඳ මෙහි සටහන් කරන්න. සියලුම සහතිකපත්වල ඡායා පිටපත් අමුණා එවන්න.) ෘ

1. ජාතික මහා ක්‍රීඩා උළෙලේ දක්‍ෂතා දිස්ත්‍රික්/පළාත්/ජාතික :

.....................................................................................................
.....................................................................................................

2. ජාතික සංගම් මගින් පවත්වනු ලබන ජාතික තරගවල දක්‍ෂතා :

.....................................................................................................
.....................................................................................................

3. ජාත්‍යන්තර තරග සඳහා සහභාගීත්වය :

.....................................................................................................
.....................................................................................................

09. (i) *ගැසට්* නිවේදනය 1.1 ඡේදයේ දක්වා ඇති කුමන ඡේදය යටතේ ඉල්ලුම් කරන්නේ ද යන්න දක්වන්න.

| අ | ආ | ඇ | ඈ | ඉ |
|---|---|---|---|---|
| | | | | |

(ii) ඉහත දක්වා ඇති එම ඡේදයේ විස්තරවී ඇති පරිදි ලබා ඇති සුදුසුකම් පිළිබඳ විස්තර. :

..................................................................................................................

..................................................................................................................

10. වෙනත් කරුණු :

..................................................................................................................

..................................................................................................................

11. මෙම පාඨමාලාවට තෝරාගනු ලැබුවහොත් රු. 60,000 ක මුදලක්, පාඨමාලා ගාස්තු වශයෙන් ගෙවීමට ඔබ සූදානම් ද, යන වග ‡

..................................................................................................................

මෙහි ඉහත මා විසින් දක්වා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මම සහතික කරමි. මෙම තොරතුරු අසත්‍ය හෝ බව යම්කිසි අයුරකින් සොයාගනු ලැබුවහොත් මෙම පාඨමාලාව හැදෑරීමට නුසුදුස්සකු වන බව හා පුහුණු පාඨමාලාවෙන් ඉවත් කරනු ලබන බව මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

---

**රජයේ පළාත් පාලන සේවයේ හා සංස්ථා සේවයේ නියුක්ත වූවන් සඳහා පමණි**

අධ්‍යක්ෂ,
ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය.

මෙම .............................................. සේවය කරන ....................... වන ................................... මහතා/මහත්මිය/මෙනවියගේ අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරන අතර, මෙම අයදුම්කරු ඉහත පාඨමාලාව සඳහා තෝරාගනු ලැබුවහොත් පාඨමාලා කාලය සඳහා ඔහුව/ඇයව සේවයෙන් නිදහස් කළ හැකි බවට සහතික කරමි.

————,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

නිල මුද්‍රාව ‡

නම :————.

තනතුර :————.

දිනය :————.